25 වන පිටෙන්

අල්ලලා උසාවි දාලා, උසාවියේදි, මෙයා ඉදිරිපත් වෙලා අර මෙයාගේ පුංචිව නිදහස් කරලා, දැන් මෙයා තමා අත් අඩංගුවේ ඉන්නෙ. එතකොට මෙයා කියන්නේ එයා දන්නේ නැතුව ළමයා අරන් ගිහින් තියෙන්නෙ කියලා" අපෙ ප්‍රශ්න හමුවේ මේ කතා දිග හැරේ.

තමන්ට උවමනා නැති ඉරණමකට බලෙන් තල්ලු කරන ලද ගැහැනු සහ දැරිවියන් , ජීවිත කාලයක්ම තමන්ට අනවශ්‍ය දරුවෙක්ගේ බර දරාගෙන ජීවත් විය යුතු ද ?
අපේ රටේ එවැනි දරුවන් , මවට එපා කියන දරුවන්, සියල්ලෝම අන්තිමට නවතින්නේ, රජයේ ළමා නිවාසවල ය. හදා ගන්නට කෙනෙක් ඉදිරිපත් නොවුනොත් මොවුන් ඒවායේ උස් මහත් වේ.

එනිසා මේ සම්මත වුනු ගබ්සා නීති ගැන මේ මොහොතේ විරුද්ධව බණ කියන්න එන කවුරුන් හෝ වෙත්නම් ඔවුන් ගැන දැනෙන්නේ පිළිකුලකි. මන්ද ඔවුන් හැමටම වඩා මේ ගැහැනුන් සහ දරුවන් විඳින දුක හොඳින්ම දැකිය හැකි ඒකක කිහිපයක මා අවුරුදු ගණනාවක් තිස්සේ වැඩ කරන නිසා ය.




ඔව් එය ජීවියෙක් කළලයක් වැනි බොහෝ තර්ක තිබෙනවා. එනමුත් කරදර කාරි ප්‍රතික්ෂේපිත පරිසරයක වැඩෙන්න සිදුවෙන ඒ දරුවා ඊට වඩා අමාරු ජීවිතයක් ගත කරනවා නොවෙ ද? මේ මව්වරුන් ට තනිව දරු බර දරන්නට වීමෙන් ඔවුන් පත් වෙන කරදරකාරි තත්වය ගැන අප සංවේදි වෙනවා ද ?

අප දකින්නේ පණ ඇති ගැහැනු ය. පණ ගහෙන ජීවි ගැහැණියකගේ , ගැහැනු දරුවෙකුගේ ජීවිතය තමන්ට අනවශ්‍ය තමන් ඉල්ලු නැති, කාටවත් වගකිව නොහැකි ජීවියෙකුගේ බරක් සමග ඉතිරි වෙනවා නම් ඒ දරුවා ඉන්පසු සමාජයේ නොයෙකුත් අකටයුතුකම් මැද දිවි ගෙවනවා නම් එය කොයි තරම් නම් සමාජ ඛේදවාචකයක්දැයි ඔබ මදකට සිතුවා ද ?

motherhood is a choice ` මාතෘත්වය යනු ස්ව කැමැත්තක්

අප හමුවට විවිධ වූ සංකූලතා ඇතිව , හොර ගබ්සා කරුවන්ගේ අලකලංචි නිසා අසාධ්‍ය තත්වයෙන් පසුවන ගැහැණුන්ද දරුවන් ද, පැමිණේ, මා විටින් විට ඔවුන් ගැන ලියා තැබුවා ඔබට මතක ඇති.
ජීවි වේවා අජීවි වේවා, ජීවත්වෙන්නට ඇති අයිතිය ගැන පඩි වදන් දොඩවන මහතුනි, නෝනාවරුනි, ඔබ අසල ඇති මහ රෝහලේ ප්‍රසව හා නාරි වේද ඒකකයට ගොස් ඇත්ත තත්වය වටහා ගන්න.

ඇගේ ගර්භාෂය ඇගේ ය. ඒ ගැන තීරණයක් ගැනීමට ඇයට නිදහස තිබිය යුතු ය

# මියුරු හද එක්කරන "මියුරු සර"

සිසිර දිසානායක

මියුරු සරින් තත් හැඬැ වී
මව් බිම වෙනුවෙන් උණු වී
කළණ මිතුරු එකමුතු වී
සුව පහසුව නිම කරව වී

පොඩි කවියක්. ඒ පොඩි කවියෙන් කියවෙන ලොකු කතාවක්.. මව් බිමෙන් විදෙස් ගත වී සංක්‍රමණිකයන් ලෙස විප්‍රවාසීන් වූ අපේ අයගේ එක කණ්ඩායමක් පිළිබඳව කියවෙන කතාවක්.

"මියුරු සර" කියන්නේ අරමුණු කීපයක් මුල් කරගෙන පිහිටවා ගත්ත සංවිධානයක්''. ඒ සංවිධානයේ ලේකම්වරිය ලලිතා විමලතිස්ස මහත්මියයි.

- සංගීතයට කැමති උදවියට ගායනයක්, වාදනයක් ඉදිරිපත් කරන්න වේදිකාවක් නිර්මාණය කිරීම.

-ඒ ගැයුම් වැයුම් අහලා, බලලා මානසික සුවයක් ලබාගන්න අවස්ථාවක් ලබා දීම,

- එකිනෙකා හමු වී දැන හැඳිනගෙන දැනුම තොරතුරු බෙදා හදා ගැනීමට තැනක්, වේලාවක් වෙන් කර දීම,
- සාමාජිකයින්ගේ දක්ෂතා විශාල ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ ප්‍රදර්ශනය කරන්නට අවස්ථාව ලබා දීම වගේම

- ලැබෙන පරිත්‍යාගවල අතිරික්ත මුදල් මව්බිමේ අසරණ දරුවන් වෙනුවෙන් යමක් කිරීමට මං සළසා ගැනීම ඒ අරමුණුවලින් කීපයක්....''

ඇය සිය කණ්ඩායමේ අරමුණු පැහැදිලි කළාය. පොඩි කවියට නිමිත්ත වන්නේ අවසන් අරමුණෙහි එක් ප්‍රතිඵලයක්.

''අනුරාධපුරයට කිලෝමීටර් හතළිහක් විතර දුරින් තියෙන සිවලාකුලම ගමේ තෝඩාමඩුව විද්‍යාලයේ අහිංසක දරු දැරියන්ට හරියාකාර වැසිකිළි පහසුකමක් තිබුණේ නෑ. ඇත්තටම ගැහැනු දරුවන්ට මේ කාරණය ලොකු ප්‍රශ්ණයක් වෙලයි තිබුණේ. අපිට එකතුවෙන පරිත්‍යාග මුදල්වල ඉතිරිය බොහොම අමාරුවෙන් පිරිමහගෙන ඒ විද්‍යාලයට වැසිකිළි තුනක ඒකකයක් හදලා දුන්නා. ඒ ඒකකයේ බිත්තියක ලියන්නයි වෛද්‍ය ලක්ෂිකා බෝගොඩ මහත්මිය ඔය කවිය ලියලා දුන්නේ.'' සැබැවින් ම මේ ''මියුරු සර'' කණ්ඩයමේ මුල් ම සද්කාර්යය නොවේ.

''මීට කලින් අපි නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේ උසස් පෙළ හදාරන දැරියන් දෙදෙනෙකුට ශිෂ්‍යත්ව දෙකක් පිරිනැමුවා. අපට මේ කටයුතුවලට උපදෙස් වගේම සම්බන්ධීකරණය කරලා දෙන්නේ ඩාවින් නගරයේ වැඩ වාසය කරන පූජ්‍ය ගරු උඩහේනේ සීලරත්න ස්වාමීන්වහන්සේ. ශ්‍රීමත් ධර්මපාල උපහාර සමාජ මෙහෙවර දියත් කරන ''සුවමඟ'' වැඩසටහන මාර්ගයෙන් තමයි මේ ශිෂ්‍යත්ව පිරිනැමීමට අපිව සම්බන්ධ කෙරුනෙ.''

''ගීත ගයන්න, විනෝද වෙන්න විතරක් යොමු නොවී සමාජ මෙහෙවරක් කරන්නටත් අපේ හැමෝම වාගේ උනන්දුයි.
විශේෂයෙන්ම සභාපති තනතුර දරන ඩඩ්ලි විමලතිස්ස, භාණ්ඩාගාරික, පසන් රවිදු කළුතන්ත්‍රි, උප සභාපති ගාමිණී ජයසිංහ කියන මහත්වරුන් වගේම කමිටු සාමාජිකා නිරංජලා ජයසිංහ මහත්මියත් මේ හැමදේකටම මූලික වෙලා මේ වැඩ කටයුතුවලට උරදෙනවා.''

''මියුරු සර'' කණ්ඩායමේ විශේෂත්වය වන්නේ මෙලෙස සමාජ සත්කාරයට යොමු වී සිටීමයි. එනමුදු ඔවුනගේ අනෙක් සියළු අරමුණු සංගීතය වටා ඒක රාශී වී ඇත්තේය.

''ඇත්තට ම මගේ මහත්මයා ඩඩ්ලි තමයි මේ කැරොකේ ක්‍රමයට ගායනා කරන්න උනන්දු වුනේ. මේ කලබලකාරි ජීවන රටාවේදී ඒක ඔහුට හොඳ මානසික සුවයක් ලබා දුන්න ඔසුවක් වුණා. අපි විනෝද වෙන අතරෙම හරවත් යමක් කරන්න පුළුවන් ද කියලා අපි නිතරම හිතනවා. දැන් අපේ කණ්ඩායමට එකතුවෙන දරුවන්, තරුණ තරුණියන් පිරිස වැඩි වෙමින් තියෙනවා. ඒ සමහර දරුවන් සිංහල කතා කරන අය නෙවෙයි. මුලින් ම ''මියුරු සරට'' ගීයක් කියන්න එකතු වුණ තරුණ පුතෙක් ලංකාවට ගිය වෙලාවෙ එයාගේම අළුත් සින්දු දෙකකුත් කරලා. ඉතින් ඒක හරි සතුටක්. පිරිස වැඩි වෙනවා වගේම ඒ අයගේ කුසලතා වැඩි දියුණු වෙන එකත් සතුටක්''.



එකී තරුණ දරුවාගේ මව දුරකථනයෙන් සම්බන්ධ කර ගැනීමට අපි සමත් විමු.

''මාත් එක්ක එකට වැඩ කරන ඩඩ්ලි අයියා තමයි සින්දු අහන්න එන්න කිව්වේ. ඇත්තම අපි කට්ටියම ගියේ සින්දු කියනවා බලන්නයි, අහන්නයි. එතන පොඩි ළමයි කීප දෙනෙකුත් සින්දු කිව්වා. ඒ ගායනා අහලා දැකලා අපේ පුතාටත් උනන්දුවක් ඇතිවෙලා. ඇත්තටම මම පුතාගේ හඬ අහලා තිබුණේ නෑ හරියට. ඒ වගේම ගායනා කරනවා දැකලා තිබුණොත් නෑ. ඉතින් මේක මට හරිම පුදුමයක්. ඉංග්‍රීසි පරිසරයක හැදෙන මේ දරුවන් අපේ දේකට, සිංහලෙන් ගයනා කරන්න යොමු වෙන එක මොන තරම් හොඳද ? ඇත්තටම එයා විරතක් නොවෙයි. මේ කොයි දරුවා වුණත් ගායනය කරනවා වාදනය කරනවා දැක්කම හරිම සතුටක් දැනෙන්නේ''

''ඒ වගේම මේ ලැබෙන සුළු මුදලින් ලංකාවේ අසරණ දරුවන්ට සුළුවෙන් හරි පිහිට වෙන්න හිතපු එක හරි වටිනවා. ඒ කාරණය නිසාමත් ''මියුරු සර''ට අපේ අය තව තව එක වෙනවා කියලයි මට හිතෙන්නේ. අපේ දරුවන්ට මෙහේ ගෙනත් පහසුකම් දෙන්න අපට පුළුවන් වුණා. එත් ලංකාවේ දරුවෝ ? ඒත් අපේම දරුවෝ නේද ? අප සිත් සංවේදී කරවමින් ඒ මව පිළිසඳර නිම කළාය. අපි ඇයට ස්තුතිවන්ත වුයෙමු.

වසර 2013 ජනවාරි 26 දා ඇරඹුණ ''මියුරු සර'' සිය සිව්වන වර්ෂ පූර්ණය සමරන්නේ ඔක්තෝම්බර් 07 වන සෙනසුරාදා සවස හතටයි. (ප. ව. 7.00) වෙස්ට් සන්ෂයින් (West Sunshine) ප්‍රදේශයේ ''ග්ලෙන් ගාලා'' ශාලාවේදි (Glen Gala Hall) පැවැත්වීමට නියමිත මේ වාර්ෂික ප්‍රසංගය පිළිබඳව වැඩිදුර තොරතුරු ලලිතා විමලතිස්ස මහත්මියගේ ජංගම දුරකථන අංකය වන 0402 961 192 ට ඇමතීමෙන් දැනගත හැකියි.

අපි ''මියුරු සර'' ට සුබ පතමින් විමලතිස්ස මහත්මියට ස්තුතිය පිරිනැමුවෙමු.

Dias Maths
M. Sc Mathematics (USA)
M. Sc Computer Science
B. Sc Mathematics
Mathematics
Grades 6 / 7 / 8 / 9 / 10
VCE – General Maths /
Maths Methods / Specialist Maths
0431 182 632
keerthicnc@yahoo.com
Home visiting
www.facebook.com/DiasMaths